සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

| 8 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සෞරග්‍රහ මණ්ඩලය දැනට වර්ෂ මිලියන ....................................................... කට පමණ පෙර විශ්වයේ පැවති දූවිලි හා වායු අංශු ඒකාබද්ධ වීමෙන් නිර්මාණය වී ඇත. (1500 / 5100 / 4600)

02. නිශ්චිත කක්ෂතලයක් හඳුනාගත නොහැකි ප්‍රමාණයෙන් කුඩා ග්‍රහලෝක .......................................................... ලෙස නම් කර ඇත. (උපග්‍රහයින් / ග්‍රහලෝක / වාමන ග්‍රහයින්)

03. සෞරග්‍රහ මණ්ඩලයේ නැගෙනහිර සිට බටහිර දෙසට භ්‍රමණය වන ග්‍රහලෝකය ...............................වේ. (යුරේනස් / සිකුරු / බ්‍රහස්පති)

04. විවිධ ප්‍රමාණයේ අයිස් අංශු වලින් සැදුණු දර්ශනීය වළලු පද්ධතියක් පිහිටා ඇත්තේ ..................................... ග්‍රහලෝකයට ය. (යුරේනස් / සෙනසුරු / නෙප්චූන්)

05. ගිම්හාන ඍතුවේ පැවති උෂ්ණත්වය ක්‍රමයෙන් අඩුවෙමින් උතුරු අර්ධගෝලයේ රටවලට සැප්තැම්බර් මාසය වන විට ද දකුණු අර්ධගෝලයේ රටවලට මාර්තු මාසය වන විට උදාවන්නේ ................................................................. ඍතුවයි. (සරත් / සිසිර / වසන්ත)

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ කියවා නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද දී ඇති වරහන් තුළ යොදන්න.

06. ග්‍රහලෝක දිදුළන හා බැබළෙන ස්වභාවයකින් යුක්ත වේ. ( )

07. පෘථිවි ගෝලයේ සමක විෂ්කම්භයට වඩා ධ්‍රැවක විෂ්කම්භය දිගින් වැඩිය. ( )

08. දකුණු ආසියානු කලාපය සමකයේ සිට උතුරු අක්ෂාංශ $38^{o}$ දක්වා විහිදේ. ( )

09. සූර්යයා මුදුන් වීම අක්ෂාංශ අනුව වෙනස්වීම නිසා පෘථිවියේ සෑම ප්‍රදේශයකටම ඍතු භේදය බලපැවැත් වේ. ( )

10. ජල වාෂ්ප, දූවිලි හා ලවණ අංශු ද වායුගෝලයේ අඩංගු වේ. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. සෞරග්‍රහ මණ්ඩලයේ මිලියන ගණනක් වන පාෂාණ කැබලිවලට අයත් වන්නේ කුමක් ද?
    (1) ග්‍රහක (2) වාමන ග්‍රහලෝක
    (3) ග්‍රහලෝක (4) උප ග්‍රහයින්

12. සිකුරු ග්‍රහයා පිළිබඳ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
    (1) පෘථිවියට ආසන්න ම ග්‍රහලෝකය යි.
    (2) ඉරබටුතරුව ලෙස හඳුන්වයි.
    (3) සෞරග්‍රහ මණ්ඩලයේ තුන්වන විශාලතම ග්‍රහලෝකය යි.
    (4) මතුපිට පෘෂ්ඨය දැක ගැනීමට අපහසුය.

13. දකුණු ආසියා රටක අගනගරයක් වන්නේ කුමක් ද?
    (1) කල්කටා (2) කරච්චිය
    (3) මුම්බායි (4) ඉස්ලාමාබාද්

14. සිංහල හා හිංදු බැතිමතුන් සමරන හිරු හා සඳු පදනම් කරගත් උත්සවයකි,
    (1) රාමලාන් (2) මහ සිකුරාදා
    (3) පාස්කු ඉරිදා (4) හජ්ජි උත්සවය

15. සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) අප ජීවත්වන පෘථිවිය ඇතුළු සෞරග්‍රහ මණ්ඩලය ග්‍රහලෝක 09 කින් සමන්විත වේ.
    (2) සූර්යයා හා එහි ගුරුත්ව බලය නිසා ඒ හා බැඳී පවතින අනෙකුත් ග්‍රහලෝක පමණක් සෞරග්‍රහ මණ්ඩලයට අයත් වේ.
    (3) ඇමරිකා එක්සත් ජනපදයේ නාසා ආයතනය පෘථිවිය මෙන් දස ගුණයකින් විශාල ග්‍රහලෝකයක් ඇති බව හඳුනාගෙන ඇත.
    (4) ගැලීලියෝ ගැලිලි විසින් ක්‍රි. ව. 1610 දී විශ්වය නිරීක්ෂණය සඳහා දුර දක්නය මුලින් ම භාවිත කර ඇත.

- **අංක 16 සිට 20 තෙක් දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

16. අන්තර්ජාතික තාරකා විද්‍යා සංගමය විසින් .......................................................................... වාමන ග්‍රහයෙකු ලෙස නම් කර ඇත.

17. ලෝකයේ දේශාංශ දෙකක් අතර ස්ථානීය වේලාව විනාඩි .................................................... කින් වෙනස් වේ.

18. ඉහළ වායුගෝලයේ ඇති ................................................................. ස්ථරය මඟින් සූර්ය විකිරණයේ ඇති අහිතකර කිරණ අවශෝෂණය කර ගනී.

19. දකුණු ආසියානු කලාපයේ පවතින්නේ ............................................................. දේශගුණය යි.


20. පෘථිවි ගෝලය අංශක ............................................................ ආනතියක් සහිතව පිහිටා ඇත.

(2 x 20 = ල. 40)

සැලකිය යුතුයි

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01. (අ) මෙම කොටසට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති දකුණු ආසියානු කලාපයේ සිතියම උපයෝගී කර ගන්න.




(i) සිංදු ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) මුම්බායි නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) O අක්ෂරයෙන් දැක්වෙන රට කුමක් ද?

(iv) A ගංගාව මුහුදට වැටෙන ස්ථානය ලියන්න.


(v) මධ්‍යම ආසියාවට අයත්වන රටක් M අක්ෂරයෙන් දැක්වේ. එය නම් කරන්න.

(vi) දූපත් විශාල ප්‍රමාණයෙන් හිමි දකුණු ආසියාවට අයත් රට දැක්වෙන අක්ෂරය ලියන්න.

(vii) තාර් කාන්තාරය දැක්වෙන්නේ කුමන අක්‍ෂරයෙන් ද?

(viii) කළුපාට කඩඉරෙන් දැක්වන නොගැඹුරු මුහුදු තීරය හඳුන්වන නම ලියන්න. (ල. 08)

(ආ) සෞරග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහලෝක කිහිපයක රූප සටහන් පහත A, B, C, D අක්ෂර වලින් දැක්වේ. ඒවා හැඳිනගෙන පිළිවෙලින් නම් කරන්න. (ල. 04)



A B C D

(ඉ) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ ග්‍රහලෝක නම් කරන්න. (ල. 04)

(i) අධිකම ගුරුත්වාකර්ෂණ බලයක් ඇති ග්‍රහලෝකය.

(ii) අධික ශීතලකින් යුක්ත ග්‍රහලෝකය.

(iii) මතුපිට උෂ්ණත්වය අධිකම ග්‍රහලෝකය.

(iv) අභ්‍යවකාශයේ රතු පැහැයෙන් දිස්වෙන ග්‍රහලෝකය

02. (i) පහත රූප සටහනේ දැක්වෙන්නේ සෞරග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහවස්තුවකි. එය නම් කරන්න. (ල. 02)



(ii) ඉහත (i) හි ඔබ නම් කරන ලද ග්‍රහවස්තුවෙහි විශේෂ ලක්‍ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(iii) (a) පෘථිවියට අයත් උප ග්‍රහයෙකු නම් කරන්න.

(b) වාමන ග්‍රහයින්ට අයත් යැයි සැලකෙන උපග්‍රහයන් ගණන කීය ද?

(c) සෞරග්‍රහ මණ්ඩලයට අයත් වාමන ග්‍රහයින් දෙදෙනෙකු නම් කර ඒවායේ හඳුනාගත හැකි විශේෂ ලක්‍ෂණ 02 ක් පැහැදිලි කරන්න. (ල. 07)

03. (i) බාහිර ග්‍රහලෝක ලෙස හඳුන්වන්නේ මොනවා ද? (ල. 02)

(ii) බාහිර ග්‍රහලෝකවල විශේෂ ලක්‍ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(iii) (a) බාහිර ග්‍රහලෝකවලට අයත්වන විශාලත ම ග්‍රහලෝක දෙක නම් කරන්න.

(b) ඉහත ඔබ නම් කරන ලද එක් ග්‍රහලෝකයක් පිළිබඳ පැහැදිලි කරන්න. (ල. 07)

04. (i) පෘථිවි භ්‍රමණය යනු කුමක් ද? ඒ සඳහා ගතවන කාලය කොපමණ ද? (ල. 02)

(ii) (a) පෘථිවියේ භ්‍රමණය සිදුවන දිශාව ලියන්න.

(b) පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන ප්‍රතිඵල දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(iii) (a) පහත රූප සටහනේ දැක්වෙන්නේ පෘථිවියේ ප්‍රධාන ඍතුවකි. එය නම් කරන්න.



(b) ඔබ නම් කරන ලද එම ඍතුව පෘථිවියේ උතුරු අර්ධගෝලයේ රටවලට හා දකුණු අර්ධගෝලයේ රටවලට උදාවන කාලය ලියන්න.

(c) නම්කරන ලද එම ඍතුවේ විශේෂ ලක්‍ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල. 06)

05. (i) දේශාංශ 0° හඳුන්වන වෙනත් නමක් ලියන්න. (ල. 02)

(ii) ආදර්ශ ලෝක ගෝලයක් ඇඳ එහි පහත සඳහන් අංශකවලින් දැක්වෙන රේඛා ඇඳ ඒවා හඳුන්වනු ලබන නම් ලියන්න. (ල. 03)

(a) අක්ෂාංශ 0°

(b) උතුරු අක්ෂාංශ 23½°

(c) දකුණු අක්ෂාංශ 23½°

(iii) දේශාංශ 0° හි වේලාව පෙ. ව. 08. 20 ලෙස සලකා පහත දැක්වෙන දේශාංශවල වේලාව ගණනය කරන්න.

(a) බටහිර දේශාංශ 45°

(b) නැගෙනහිර දේශාංශ 85° (ල. 06)

06. (i) වායුගෝලය ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ල. 02)

(ii) (a) වායුගෝලයේ අඩංගු ප්‍රධානම වායු වර්ග දෙක (පරිමාව, ප්‍රතිශත අගයන් වැඩිම) නම් කරන්න.

(b) වායුගෝලයේ සංයුතිය වෙනස්වීමට හේතුවන මානව ක්‍රියාකාරකම් දෙකක් පැහැදිලි කරන්න. (ල. 03)


(iii) (a) පෘථිවියේ ජලය පවතින ආකාර දෙකක් ලියන්න.

(b) ජල චක්‍රය ලෙස හඳුන්වන්නේ කුමක් ද?


(c) මානවයාගේ පැවැත්ම සඳහා ජලය වැදගත්වන ආකාර දෙකක් පැහැදිලි කරන්න. (ල. 06)

07. (i) දකුණු ආසියානු කලාපයේ සාපේක්ෂ පිහිටීම ලියන්න. (ල. 02)

(ii) පහත A, B හා C වලින් දක්වා ඇත්තේ දකුණු ආසියාවට අයත් රාජ්‍ය කිහිපයක ජාතික කොඩි වේ.


A


B


C

(a) A ජාතික කොඩිය අයත් රට කුමක් ද?

(b) B ජාතික කොඩිය අයත් රටෙහි අගනගරය ලියන්න.

(c) C ජාතික කොඩිය හිමි රටෙහි කැපී පෙනෙන ආර්ථික කටයුත්තක් ලියන්න. (ල. 03)

(iii) (a) දකුණු ආසියානු කලාපයට අයත් දූපත් රාජ්‍ය 02 ක් ලියන්න.

(b) දකුණු ආසියානු කලාපය සුවිශේෂී භූගෝලීය කලාපයක් වීමට බලපා ඇති හේතු 03 ක් පැහැදිලි කරන්න. (ල. 06)

08. (i) හිමාලය වැටියට අයත් කඳුවැටි 02 ක් ලියන්න. (ල. 02)

(ii) හිමාලය කඳුකර භූ දර්ශනයේ දැකගතහැකි භූ රූප ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) හිමාලය කඳුවැටියේ වාසය කරන ගෝත්‍රික ජන වර්ග 02 ක් ලියන්න.

(b) හිමාලය කඳුකර ආශ්‍රිතව ඇතිකරනු ලබන සතුන් වර්ග 02 ක් නම් කරන්න.

(c) කඳුකර භූ දර්ශනයට හැඩගැසුණු මානවයින්ගේ විශේෂිත ශාරීරික ලක්ෂණ 02 ක් පැහැදිලි කරන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4600 | 06. | ✗ | 11. | 1 | 16. | ප්ලූටෝ |
| 02. | වාමන ග්‍රහයන් | 07. | ✗ | 12. | 3 | 17. | 4 |
| 03. | සිකුරු | 08. | ✓ | 13. | 4 | 18. | ඕසෝන් වායුව |
| 04. | සෙනසුරු | 09. | ✗ | 14. | 1 | 19. | නිවර්තන |
| 05. | සරත් | 10. | ✓ | 15. | 4 | 20. | 23 ½º |

(2 x 20 = ල. 40)

## II කොටස

01 (අ) (i) C (ii) H (iii) භූතානය (iv) බෙංගාලබොක්ක
(v) ඇෆ්ගනිස්ථානය (vi) N (vii) D (viii) පෝක් සමුද්‍ර සන්ධිය
(ආ) A - බ්‍රහස්පති B - පෘථිවිය C - යුරේනස් D - සෙනසුරු
(ඉ) (i) බ්‍රහස්පති (ii) නෙප්චූන් (iii) සිකුරු (iv) අඟහරු

02. (i) ග්‍රාහක කැබැල්ලක් (ල. 02)
(ii) ඝන පාෂාණවලින් නිර්මාණ වී තිබීම. / නිශ්චිත හැඩයක් නොමැති වීම. / විවිධ විශාලත්වයෙන් යුක්ත වීම කරුණු 02 ට ලකුණු 02 යි.
(iii) (a) චන්ද්‍රයා (ල. 01) (b) 08 යි. (ල. 01)
(c) ප්ලූටෝ, සෙරිස්, එරිස්, මාකේ මාකේ, හෝමියා නම් කිරීමට (ල. 02)
ලක්ෂණ - නිශ්චිත කක්ෂ තලයක් හඳුනාගත නොහැකි වීම. / ග්‍රහලෝකවලට වඩා ප්‍රමාණයෙන් කුඩා වීම ලක්ෂණ ලිවීමට. (ල. 03)

03. (i) ග්‍රාහක වළල්ලෙන් පිටත පිහිටි ග්‍රහලෝක වේ. (ල. 02)
(ii)
- ★ වායුමය සංයුතියකින් යුක්ත වේ.
- ★ අභ්‍යන්තර ග්‍රහලෝකවලට වඩා ප්‍රමාණයෙන් විශාල වේ.
- ★ උපග්‍රහයින් වැඩි සංඛ්‍යාවක් ඇත. (වැනි ලක්ෂණ 02 ක් ලිවීමට ල. 02)

(iii) (a) බ්‍රහස්පති, සෙනසුරු (ල. 02)
(b) <u>බ්‍රහස්පති</u>
- ★ ග්‍රහලෝක අතර විශාලත ම ග්‍රහලෝකය වේ.
- ★ පෘථිවියේ විශ්කම්භය මෙන්දස ගුණයක් විශාල වේ.
- ★ බ්‍රහස්පති මත අඳුරු පැහැති පටි වැනි ප්‍රදේශ මෙන් ම දීප්තිමත් ප්‍රදේශ ද දැකගත හැකිය.
- ★ අධිකම ගුරුත්වාකර්ෂණ බලයක් ඇත.
- ★ උප ග්‍රහයින් වැඩිම සංඛ්‍යාවක් සිටින ග්‍රහලෝකය වේ.


<u>සෙනසුරු</u>
- ★ සෞරග්‍රහ මණ්ඩලයේ දෙවන විශාලත ම ග්‍රහලෝකය වේ.
- ★ පෘථිවිය මෙන් නව ගුණයක් පමණ විශාල වේ.
- ★ දර්ශණීය වළලු පද්ධතියක් පිහිටා ඇත. මෙම වළලු විවිධ ප්‍රමාණයේ අයිස් අංශුවලින් සෑදී ඇත.
- ★ උප ග්‍රහයින් 62 ක් අයිතිය. යනා දී කරුණු විස්තර කර ඇත්නම් (ලකුණු 05)

04. (i) පෘථිවිය තම අක්ෂය වටා කැරකීමයි. (ල. 01) පැය 23 යි විනාඩි 56 කි. (ල. 01)
(ii) (a) බටහිර සිට නැගෙනහිර දෙසට (ල. 01)
(b) දිවා රාත්‍රී ඇතිවීම. / වේලාවේ ප්‍රාදේශීය වෙනස්කම් ඇතවීම යන කරුණු 02 පැහැදිලි කිරීමට (ලකුණු 02)
(iii) (a) සිසිර ඍතුව / ශීත ඍතුව (ල. 01)
(b) උතුරු අර්ධගෝලයේ රටවලට - දෙසැම්බර් මාසය
දකුණු අර්ධගෝලයේ රටවලට - ජූනි මාසය (ල. 02)
(c)
- ★ රාත්‍රී කාලය දිගින් වැඩි වේ.
- ★ ශාක පත්‍ර සම්පූර්ණයෙන් ම හැලී යයි.
- ★ බොහෝ ප්‍රදේශවලට හිම පතනය සිදු වේ.

(වැනි විශේෂ ලක්ෂණ දෙකක් පැහැදිලි කිරීමට ල. 03)

05. (i) ග්‍රිනිච් මධ්‍යහන රේඛාව (ල. 02)

(ii)



(ල. 03)

(iii) (a) පෙ. ව. 5. 20 (b) ප. ව. 2. 00 (ල. 06)

06. (i) පෘථිවියේ ගුරුත්වාකර්ෂණ ශක්තිය නිසා පෘථිවි තලය හා බැඳී පවතින විවිධ වායු වර්ගවලින් සමන්විත කොටස. (ල. 02) (නිවැරදි හැඳින්වීමට ලකුණු දෙන්න.)

(ii) (a) නයිට්‍රජන්, ඔක්සිජන් (ල. 01)

(b)
- ★ වානාන්තර ගිනි තැබීම.
- ★ වනාන්තර විනාශ කිරීම.
- ★ කැලි කසල එකතු වීම. (කැලිකසල ගිණි තැබීම.)
- ★ කර්මාන්තශාලාවලින් පිටකරන දුම් පිටකිරීම.
- ★ වාහන වලින් දුම පිටකිරීම වැනි කරුණු දෙකක් පැහැදිලි කිරීමට (ල. 02)

(iii) (a) ද්‍රව, ඝන, වායු (ල. 01)

(b) ජලය ගොඩබිම සහ වායුගෝලය අතර චක්‍රීයව සංසරණය වීමයි. (ල. 01)

(c)
- ★ ගෘහස්ත කටයුතු සඳහා
- ★ කෘෂි කාර්මික කටයුතු සඳහා
- ★ ධීවර කර්මාන්තය සඳහා
- ★ ජල විදුලි බලය නිපදවීමට
- ★ විනෝද කටයුතු සඳහා (ජල ක්‍රීඩා)
- ★ පරිවහන කටයුතු සඳහා
- ★ විවිධ කර්මාන්ත සඳහා වැනි කරුණු 02 ක් ලියා පැහැදිලි කිරීම. (ල. 04)

07. (i) උතුරින් - හිමාලය කඳුවැටියෙන් ද
දකුණින් - ඉන්දියන් සාගරයෙන් ද
නැගෙනහිරින් - බෙංගාල බොක්ක
බටහිරින් - අරාබි මුහුද (ල. 02)

(ii) A - බංග්ලාදේශය B - නේපාලය - කත්මන්ඩු
C- මාලදිවයින - ධීවර කර්මාන්තය / සංචාරක කර්මාන්තය (ල. 03)

(iii) (a) අන්දමන් හා නිකොබාර් දූපත් (ල. 02)

(b)
- ★ ලොව ඉහළ ම කඳු මුදුන පිහිටා තිබීම.
- ★ වගුරු බිම් පිහිටා තිබීම.
- ★ කාන්තාර ප්‍රදේශ මෙන් ම අධික ශිතලෙන් යුක්ත ප්‍රදේශ පැවතීම.
- ★ ඝන වනාන්තර ප්‍රදේශ
- ★ තෘණ භූමි පැවතීම. වැනි හේතු 03 ක් පැහැදිලි කිරීමට ලකුණු 04

08. (i) කුන්ලුන්ෂාන් සහ කාරකෝරම් (ල. 02)

(ii) කඳු, තෙරු, ගංදෝරු, දුර්ග, උස්බිම්, සානු, කපොලු (ල. 03)

(iii) (a) භූටියා, කසා, දරඩි, ලෙප්චා, ෂෙර්පා (ල. 01)

(d) ගවයන් සහ බැටළුවන් (ල. 01)

(c)
- ★ පැතලි පුළුල් පතුල් සහිත පාද පිහිටා තිබීම.
- ★ ශක්තිමත් වූ බාහු පිහිටීම.
- ★ අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත්වීමට හැකි අයුරින් සකස් වූ පෙනහළු පිහිටා තිබීම. මින් දෙකක් පැහැදිලි කිරීමට (ල. 04)